## බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

8 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය :- පැ. 1 1/2

නම :- ............................ ඇ.අංකය :- ..................... පංතිය :- ..........

# I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ''කුසල්'' හැඳින්වීම සඳහා යෙදෙන වෙනත් යෙදුමකි.

   (i) අධම්ම චර්යා (ii) අකුසල් (iii) සම චර්යා (iv) විසම චර්යා

2. අධම්ම චර්යාවේ හැසිරීමෙන් ,

   (i) මෙලොවදී පමණක් දුකට භාජනය වේ.

   (ii) මෙලොවදී පමණක් සැපයට භාජනය වේ.

   (iii) මෙලොවදී හා පරලොවද සැපයට භාජනය වේ.

   (iv) මෙලොව දී හා පරලොවද දුකට භාජනය වේ.

3. කයෙන් කරන අකුසල ක්‍රියාවලට අයත් වෙන්නේ,

   (i) කේලාම් කීම (ii) දැඩි ලෝභය (iii) බොරුකීම (iv) සතුන් මැරීම

4. 'දොමනස්ස' ලෙස හඳුන්වන්නේ,

   (i) කායික පීඩාවන්ය. (ii) මානසික පීඩාවන්ය.

   (iii) දිරායාමය. (iv) ලෙඩවීමය.

5. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව

   (i) කරණීය මෙත්ත සූත්‍රය (ii) සච්ච විභංග සූත්‍රය

   (iii) ධම්මචක්කප්පවත්තන සූත්‍රය (iv) මහා මංගල සූත්‍රය

6. පසිඳුරන් පිනවීමට ඇති ආශාව,

   (i) කාම තණ්හා (ii) රූප තණ්හා

   (iii) භව තණ්හා (iv) විභව තණ්හා

7. දුකට හේතුව,

   (i) මෝහය (ii) කෝපය (iii) ලෝභය (iv) තණ්හාව

8. 'පොට්ඨබ්බ තණ්හා' යනු,

   (i) පසිඳුරන් පිනවීම (ii) ඇස පිනවීම

   (iii) කය පිනවීම (iv) දිව පිනවීම

9. 'චක්කවරං කිත රත්ත සුපාදෙ' යන්න අයත් වන්නේ,

(i) ධම්ම පදයටය. (ii) නරසීහ ගාථාවලටය

(iii) සුභාෂිතයටය. (iv) ලෝ වැඩ සඟරාවටය.

10. සියළුම කායික හා මානසික පීඩාවන්,

(i) දුක්ඛ සත්‍ය වේ. (ii) දුක්ඛ සමුදයාර්ය සත්‍ය වේ.

(iii) දුක්ඛ දුක්ඛ සත්‍ය වේ. (iv) දුක්ඛ නිවන් සත්‍යය වේ.

11. ත්‍රිවිධ තණ්හාවට අයත් නොවන්නේ,

(i) කාම තණ්හා (ii) රූප තණ්හා (iii) භව තණ්හා (iv) විභව තණ්හා

12. 'සඳකිඳුරු ජාතකය' දේශනා කළේ,

(i) මහාමායා දේවිය වෙනුවෙන් (ii) ප්‍රජාපතී ගෝතමී දේවිය වෙනුවෙන්

(iii) යශෝධරා දේවිය වෙනුවෙන් (iv) කිසාගෝතමී වෙනුවෙන්

13. මළ මිණියක් පිටේ බැඳ අමු සොහොනක තනිවී සිට, බුදුන් වහන්සේ පිහිට වූ දරුවා,

(i) සුනීත (ii) සෝපාකය (iii) රජ්ජුමාලාය (iv) කපිලය

14. විඤ්ඤාණය නම්,

(i) ඤාණයයි (ii) සිතයි (iii) කයයි (iv) ආශාවයි.

15. බුදුරජාණන් වහන්සේ විසින් කර්මය පිළිබඳව දේශනා කර ඇති සූත්‍රය වන්නේ,

(i) සච්ච විභංග සූත්‍රය (ii) චූල්ල කම්ම විභංග සූත්‍රය

(iii) දම්සක් පැවතුම් සූත්‍රය (iv) මෙත්තානිසංස සූත්‍රය

- **අංක 16 - 20 දක්වා ඇති වගන්ති වල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.**

16. පව් කිරීමට ඇති ලජ්ජාව හා බය ............................................................ලෙස හඳුන්වයි.

17. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනු ..............................................වේ.

18. දුක්පීඩාවන් විඳීමෙන් සිතේ ඇතිවන වෙහෙසකාරී බව ............................................. යි.

19. බුදු දහමේ මූලික ඉගැන්වීම ........................................................... නම් වේ.

20. ඇතැම් සත්ත්වයන් මරණින් පසු සුගතියට පැමිණීමට හේතුව ................................... ය.

**(උපායාස, ධම්ම චර්යාව, චතුරාර්ය සත්‍යය, ලෝක පාලන ධර්ම, පංචස්කන්ධය)**

## II කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. (i) කුසල් හා අකුසල් හැඳින්වෙන වෙනත් වචන 01 බැගින් ලියන්න.
   (ii) දස අකුසල් පිළිවෙලින් ලියන්න.
   (iii) මරණින් මතු දුගතිගාමී වීමට හේතු දක්වා එක් උදාහරණයකින් පැහැදිලි කරන්න.

2. (i) "උත්තිට්ඨේ නප්පමජ්ජෙය්‍ය" යන ගාථාව සම්පූර්ණ කරන්න.
   (ii) එහි තේරුම ලියන්න.

3. (i) චතුරාර්ය සත්‍යය පිළිවෙලින් නම් කරන්න.
   (ii) දුක්ඛ සත්‍යය යන්න හඳුන්වන්න.
   (iii) දුක්ඛ සත්‍යයේ වන දුක් 12න් 02 ක් විස්තර කරන්න.

4. (i) දුක්ඛ සමුදයාර්ය සත්‍යයේ එන ත්‍රිවිධ තණ්හා නම් කරන්න.
   (ii) ඒ එකින් එක විස්තර කරන්න.

5. ජීවිත අභියෝග ජය ගැනීම සඳහා බුද්ධ චරිතයෙන් ආදර්ශ ගත හැකි සිද්ධි 03ක් නම්කරන්න.

# පළමු වාර පරීක්ෂණය - 2012
## බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

8 ශ්‍රේණිය | ඉතිහාසය | කාලය :- 1 1/2

නම :- .............................. ඇ.අංකය :- .............................. පංතිය :- ..........

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශ්‍රී ලංකාවේ නිදහස රැකීමෙහි යෙදීසිටි අවසාන රාජධානිය වන්නේ,
   (i) යාපහුව (ii) ගම්පොළ (iii) උඩරට (iv) කෝට්ටේ

2. උඩරට රාජධානිය ආරම්භයේ දී සමන්විත වූ ප්‍රදේශ ගණන,
   (i) 5 කි. (ii) 4කි. (iii) 3කි. (iv) 2 කි.

3. ජෝතිය සිටුවරයා විසින් උඩරට ඇති කළ කැරැල්ල මැඩලූයේ,
   (i) සපුමල් කුමරු (ii) අම්බුළුගල කුමරු
   (iii) ටිකිරි කුමරු (iv) ඉහත කිසිවකු නොවේ.

4. උඩරට රාජධානියේ ආරම්භක රජු වූයේ,
   (i) සේනා සම්මත වික්‍රමබාහු (ii) Iවන රාජසිංහ
   (iii) විජය රාජසිංහ (iv) කාන්නසාමි කුමරු

5. 1574 දී තම සේනාව මෙහෙයවා උඩරට ප්‍රදේශ ආක්‍රමණය කොට බලන දුර්ගය අල්ලා ගත්තේ,
   (i) මායාදුන්නේ රජු (ii) පළමුවන රාජසිංහ රජු
   (iii) දෙවන රාජසිංහ (iv) විමලධර්මසූරිය රජු

6. සාමන්ත යනු කවරෙක්ද?
   (i) පාලකයාය. (ii) පුරෝහිතයාය.
   (iii) ප්‍රාදේශීය පාලකයාය. (iv) රජතුමාය.

7. 1594 දී දන්තුරේ සටන මෙහෙය වූ පෘතුගීසි නායකයා වූයේ,
   (i) කොන්ස්තන්තීනු ද සා (ii) පෙරෙයිරා ද ලසර්දා
   (iii) දියෝගු ද මේලෝ (iv) පේරෝ ලෝපේස් ද සූසා

8. ගන්නොරුව සටනට නායකත්වය දුන් සිංහල රජු,
   (i) පළමුව රාජසිංහ (ii) දෙවන රාජසිංහ
   (iii) ශ්‍රී වික්‍රම රාජසිංහ (iv) කීර්ති ශ්‍රී රාජසිංහ

9. උඩරට රාජධානියේ අවසන් සිංහල රජු වූයේ,

(i) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (ii) විජය රාජසිංහ

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ (iv) රාජාධි රාජසිංහ

10. නායක්කාර් වංශයේ ආරම්භක රජු වූයේ,

(i) ශ්‍රී වික්‍රම රාජසිංහ (ii) රාජාධි රාජසිංහ

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ (iv) දෙවන රාජසිංහ

11. වැලිවිට සරණංකර හිමියන්ට රාජගුරු පදවිය පිරිනමන ලද්දේ,

(i) විමලධර්මසූරිය රජු (ii) රාජසිංහ රජු

(iii) ශ්‍රී විජය රාජසිංහ රජු (iv) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

12. ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වූයේ,

(i) ටොරින්ටන් සාමි (ii) රොබට් බ්‍රවුන්රිග්

(iii) එඩ්වඩ් බාන්ස් (iv) ෆෙඩ්රික් නෝත්

13. රජුගේ පුද්ගලික ආරක්ෂාව භාර ලේකම් හැඳින්වූයේ,

(i) මඩුවේ ලේකම් (ii) බත් වඩන ලේකම්

(iii) අතපත්තුවේ ලේකම් (iv) මහ මොහොට්ටාල

14. විහාර දේපොළ කාර්යාංශයේ සිටි නිලධාරියෙකි.

(i) දියවඩන නිලමේ (ii) දිසාවේවරු

(iii) මහා අදිකාරම් (iv) රටේ මහත්වරු

15. කුඹල්කරුවන්ගෙන් බදු අයකළ දෙපාර්තමේන්තුව

(i) කුරුවේ බද්ද (ii) මඩිහෙ බද්ද

(iii) බඩහැල බද්ද (iv) මේ කිසිවක් නොවේ.

16. මුත්තුසාමි කුමාරයා වෙනුවට කන්නසාමි කුමාරයා රජකමට පත්කළේ,

(i) ඇහැලේපොළ අදිකාරම් (ii) පිළිමතලව්වේ මහාදිකාරම්

(iii) සමනක්කොඩි අදිකාරම් (iv) ලෙව්කේ දිසාවේ.

17. උඩරට රාජ්‍ය යටත් කරගැනීමට මගපෙන්වූ භාෂා පරිවර්තකයා වූයේ,

(i) ජොන් ෆයිබස් (ii) ජෝන් ඩොයිලි

(iii) ෆෙඩරික් නෝර්ත් (iv) දියෝගු ද මෙලෝ

18. ප්‍රාදේශීය පාලන කටයුතු සඳහා උඩරට රාජධානිය බෙදී තිබූ කොටස් ගණන වූයේ,

(i) දිසාවන් 12, රට 8 කි. (ii) දිසාවන් 9 රට 12 කි.

(iii) දිසාවන් 12 රට කි. (iv) දිසාවන් 9 රට 10 කි.

19. තුප්පොට්ටිය යනු,

(i) බඳවටා අඳින රෙද්දකි. (ii) කාන්තා ඇඳුමකි.

(iii) පිරිමි අයගේ කමිසයකි. (iv) ළමා ඇඳුමකි.

20. විදේශීය වෙළඳාමේ ඒකාධිකාරී බලය තිබුණේ,

(i) රජතුමාට ය. (ii) පුරෝහිතයාට ය.

(iii) මහාදිකාරම්ට ය. (iv) ගම්කටය.

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.

1. ඔබ විසින් 8 ශ්‍රේණියේ ඉතිහාසය විෂයය යටතේ පළමු වාරය සඳහා ඇගයීමක් සිදුකර ඇත. එම අනිවාර්ය ඇගයීම ඇසුරු කරගනිමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

(i) ඔබ විසින් කරන ලද ඇගයීම කුමක් ද?

(ii) ඒ සඳහා අදාළ කරගත් පාඩම් මාතෘකාව කුමක් ද?

(iii) එහිදී ඔබ විසින් තොරතුරු ලිවීමට යොදාගත් අනුමාතෘකා මොනවා ද?

(iv) මේ සඳහා ඔබ විසින් තොරතුරු සෙවීමට යොදාගත් මූලාශ්‍ර 2 ක් ලියන්න.

(v) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ ලැබූ ප්‍රයෝජන 02ක් ලියන්න.

(vi) එහිදී ඔබ මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න.

2. (i) උඩරට රාජධානිය හැඳින්වූ නම් තුනක් ලියන්න.

(ii) උඩරට රාජ්‍ය ආරම්භ වූ කාලයේ අයත්ව තිබූ ප්‍රදේශ 04ක් නම් කරන්න.

(iii) (අ) සාමන්ත යනු කවරෙක් ද?

(ආ) උඩරට රාජධානියේ සිටි සාමන්තවරු දෙදෙනෙකු නම්කරන්න.

3. (i) ලස්කිරිඤ්ඤ හමුදාව යනු කවරෙක් ද?

(ii) (අ) පහත පුද්ගලයන් බෞතිස්ම ලැබූ (කිතුණු ආගමිකයින් බවට පත්වීම) නම් මොනවා ද?

- කුසුමාසන දේවිය
- කොනප්පු බණ්ඩාර
- යමසිංහ බණ්ඩාර

(ආ) සීතාවක රාජසිංහ උඩරට ආක්‍රමණය කළ අවස්ථාවක් ලියන්න.

(iii) පළමුවන විමලධර්මසූරිය රජුගේ ආගමික සේවාවන් මොනවාදැයි විස්තර කරන්න.

4. (i) පළමුවන විමලධර්මසූරිය රජු උඩරට රාජධානියක නීත්‍යානුකූල හිමිකරු වූයේ කෙසේ ද?

(ii) පහත සටන් සඳහා නායකත්වයක් දුන් උඩරට රජු හා පෘතුගීසි අතර නායකයින් නම්කරන්න.

- දන්තුරේ සටන -
- බලන සටන -

(iii) පළමුවන විමලධර්මසූරිය රජු උඩරට රාජ්‍යයට එක්කරගත් ප්‍රදේශ මොනවාද?

5. (i) දෙවන රාජසිංහ රජු නායකත්වය දුන් සටන් දෙක නම්කරන්න. එවා සිදුවූ වර්ෂ ලියන්න.

(ii) පෘතුගීසින් පලවා හැරීමට දෙවන රාජසිංහ රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග 04ක් ලියන්න.

(iii) නායක්කර් වංශික රජවරු නම් කරන්න.

6. (i) උපසම්පදා කර්මය නැවත පිහිටුවීමට බුරුමයෙන් භික්ෂූන් වහන්සේලා ගෙන්වූ උඩරට රජවරු තිදෙනෙක් නම් කරන්න.

(ii) රදළ වරුන්ගේ බලය මැඩලීමට ශ්‍රී වික්‍රම රාජසිංහ අනුගමනය කළ ක්‍රියාමාර්ග 04ක් ලියන්න.

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ජනතාව අතර අප්‍රසාදයට ලක්වීමට හේතු 04ක් ලියන්න.

7. (i) උඩරට රාජසභාවේ සිටි මහවාසල තිලධාරීන් තිදෙනෙකු නම් කරන්න.

(ii) පහත ඒවා හඳුන්වන්න.

ගබඩාගම් -

නින්දගම් -

විහාරගම්

දේවාල ගම් } -

පරවේණි ඉඩම්

(iii) උඩරට රාජධානියේ ආර්ථික කටයුතු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

## පළමු වාර පරීක්ෂණය - 2012
## බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

| 8 ශ්‍රේණිය | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | කාලය :-පැ.1 1/2 |
|---|---|---|

නම :- .................................................. ඇ.අංකය :- ................................ පංතිය :- ............

### I කොටස

- සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. පූර්ණ සෞඛ්‍යය යනු,

    (i) ලෙඩ රෝග වලින් තොර වීම.

    (ii) දුබලතාවයන්ගෙන් තොර වීම.

    (iii) කායික, මානසික, සමාජීය, හා ආධ්‍යාත්මික යහපැවැත්මේ පූර්ණත්වයයි.

    (iv) ඉහත සඳහන් සියල්ල

2. කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය සෞඛ්‍යය ප්‍රවර්ධන පාසලකි. එම විද්‍යාලය තුළ දැකිය නොහැක්කේ,

    (i) පිරිසිදු පංති කාමර (ii) පියන් රහිත ජල ටැංකි

    (iii) ක්‍රමවත් මල් පාත්ති (iv) සුහදශීලි සබඳතා

3. මානසික පරිසරය ක්‍රමවත් කිරීම සඳහා සෞඛ්‍යය ප්‍රවර්ධනයට කැපවුණු පාසලක දැකිය හැකි සෞඛ්‍යය ප්‍රතිපත්තියක් නොවන්නේ,

    (i) පොලිතින් පාසලට රැගෙන නොඒම

    (ii) සෑම දරුවෙක් ම කුමන හෝ විෂය බාහිර ක්‍රියාකාරකමකටවත් සහභාගී වීම.

    (iii) ක්‍රමවත් කුණු කසල බැහැර කිරීම.

    (iv) වැසිකිලි කැසිකිලි ක්‍රමවත් ව නඩත්තු කිරීමෙන් වැලකීම.

4. පාසල් සෞඛ්‍යය කළමනාකරණය කමිටුවේ සභාපතිත්වය දරනුයේ,

    (i) නියෝජ්‍යය විදුහල්පතිතුමා (ii) සහකාර විදුහල්පතිතුමා

    (iii) නියෝජ්‍යය හෝ සහකාර විදුහල්පතිතුමා (iv) සෞඛ්‍යය විෂය භාර ගුරුතුමා

- මෙවර නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙලේ දී වයස අවුරුදු 15 න් පහළ විසිකිරීමේ ඉසව් කාණ්ඩය සඳහා සහභාගි වූ සිසුන් තිදෙනෙක් තම උපකරණය විසිකල ආකාරය පහත දැක්වේ. මෙම තොරතුරු අනුව 05 සිට 07 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

| නම | උපකරණය විසිකල ආකාරය |
|---|---|
| මවිත් | ඉහලින් ඈතට විසිකිරිම |
| ලහිරු | පැත්තෙන් ඈතට විසිකිරීම |
| රුසිරු | ඉදිරියට දැමීම |

5. ලහිරු සහභාගි වී ඇති ඉසව්ව වන්නේ,

(i) කවපෙත්ත විසිකිරිම (ii) හෙල්ල විසිකිරිම

(iii) යගුලිය දැමීම (iv) මිටිය විසිකිරිම

6. හෙල්ල විසිකිරීමේ පිටිය වෙත වර්තා කරන්නට ඇත්තේ,

12. ආත්ම අභිමානය වර්ධනයට සහයෝගය දක්වන්නේ,

(i) ගුරුවරුන් (ii) දෙමාපියන්
(iii) යහලුවන් (iv) ඉහත සියලුදෙනා

13. යෞවනයන් අපේක්ෂා නොකරන දේ තෝරන්න.

(i) ප්‍රශංසාවට ලක්වීම (ii) අත්දැකීම ලබාගැනීම
(iii) අන් අය යටතේ සිටීම (iv) යම් යම් දේවල් සන්තක කරගැනීම

14. ඔබ තුළ ඇති විය හැකි කායික කුසලතාවයක් නොවන්නේ,

(i) දිවීම (ii) නිවැරදි ඉරියව්
(iii) ඉවසීම (iv) ශාරීරික යෝග්‍යතා සාධක

15. රිද්මයානුකුල පා චලනයක් නොවන්නේ,

(i) මාර්ච් (March) (ii) ස්කිප් (Skip)
(iii) රෝද කරනවා (Cart Weel) (iv) කික් (Kick)

16. 2010 සාෆ් ක්‍රීඩා තරඟ පැවැත් වූ රට කුමක් ද?

(i) ශ්‍රී ලංකාව (ii) බංගලාදේශය
(iii) ඉන්දියාව (iv) නේපාලය

17. ශ්‍රී ලංකාවට මුල්ම ඔලිම්පික් පදක්කම ගෙන ආවේ,

(i) ශ්‍රියානි කුලවංශ (ii) ඩන්කන් වයිට්
(iii) සුගත් තිලකරත්න (iv) සුසන්තිකා ජයසිංහ

18. වොලිබෝල් ක්‍රීඩාවේ දක්ෂතාවයක් නොවනුයේ,

(i) පාද හුරුව (ii) පිරිනැමීම (iii) ලබාගැනීම (iv) පහර දීම

19. 2011 වර්ෂයේ දකුණු ආසියානු වෙරළ ක්‍රීඩා උළෙල (Beach Games) පැවැත් වූ රට කුමක් ද?

(i) ශ්‍රී ලංකාව (ii) ඉන්දියාව (iii) එංගලන්තය (iv) ඇමරිකාව

20. 2012 වර්ෂයේ ඔලිම්පික් ක්‍රීඩාව පැවැත්වෙන රට වනුයේ,

(i) ජර්මනිය (ii) ග්‍රීසිය (iii) එංගලන්තය (iv) ඇමරිකාව

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. කොට්ටාව උතුර විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ විවිධ දිවීම, පැනීම, විසිකිරීම් ඉසව් සඳහා සරළාගේ යහළු යෙහෙළියන් සහභාගි විය. නිලූට හා සඳූට හා සරළාට පාදයේ ආබාධ හේතුවෙන් සහභාගි වීමට නොහැකි විය. හොඳින් ක්‍රීඩා උත්සවය නිරීක්ෂණය කර අවශ්‍ය තොරතුරු සටහන් කරගන්නා ලෙස සෞඛ්‍යය විෂය භාර ගුරුතුමා ඔවුන්ට පැවසීය.

(i) සරළාගේ පාසලේ පැවැත් වූ දිවීම් ඉසව් 02 ක් ලියන්න.

(ii) අනූ, විසිකිරීම් ඉසව් දෙකකට සහභාගි වී නම් ඇ භාවිතා කළ විසිකිරීම් උපකරණ 02ක් නම් කරන්න.

(iii) කමල් කෙටිදුර දිවීමේ ඉසව්වකට සහභාගි විය. ඔහු තරඟය ආරම්භ කළ ක්‍රමය කුමක් ද?

(iv) මෙලාන් වැඩිම තිරස් දුරක් පැන ජයග්‍රහණය කිරීමට නම් සහභාගි විය යුතු පැනීම් ඉසව් දෙක ලියන්න.

(v) නාලන් පැනීම් ඉසව් දෙකකට හා විසි කිරීම් ඉසව්වකට සහභාගි විය. මීටර් 100 දිවීම. සඳහාද එම ස්ථානයට ගියේ නම් විනිසුරුවරුවකු වශයෙන් ඔබ ඔහුට ඒ සඳහා සහභාගි වීමට ඉඩ දෙනවාද?

(vi) නීති විරෝධී පැනීම් 03ක් හේතුවෙන් තරඟයෙන් ඉවත් කෙරුණු මිලාන් විනිසුරුට බැන වැදීමට සූදානම් වන විට නිවාසාන්තර ආචාර්යතුමා එය වලක්වා ක්‍රීඩකයකු එක් ගුණාංග කියාදුනි. එවන් ක්‍රීඩක ගුණාංග දෙකක් ලියන්න.

(vii) ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූයේ ශ්‍රී ලංකාවට ඔලිම්පික් පදක්කමක් ගෙන ආ ක්‍රීඩිකාවකි. ඇය කවුද?

(viii) ප්‍රධාන ආරාධිත අමුත්තිය මීළඟ ඔලිම්පික් උළෙල රූපවාහිනිය ඔස්සේ නරඹා, අත්දැකීම් ලබාගෙන ඊළඟ ඔලිම්පික් උළෙලට යාමට අදිටන් කරගන්නා බව පැවසීය. මීළඟ ඔලිම්පික් උළෙල පැවැත්වෙන්නේ කුමන වර්ශයේද කුමන රටේද?

(ix) ඔබට එම වර්ෂයේ පැවැත්වෙන ඔලිම්පික් උළෙල නැරඹීමට නොහැකි වුවහොත් නැවත ඔලිම්පික් උළෙලක් නැරඹීමට වසර කීයක් බලා සිටිය යුතුද?

(x) විද්‍යාලයේ හිටපු දක්ෂ ක්‍රීඩකයකු දකුණු ආසියාතික තරඟ සඳහා තේරී පත්ව ඇති බව විදුහල්පතිතුමා පැවසීය. නාලනී ඒ සඳහා (2010 වර්ෂයේ) සහභාගි වූ රට කුමක් ද?

(ල. 20)

02. යුද්ධය ජයග්‍රහණයත් සමඟම, ලෝකයේ විශිෂ්ඨතම හා විනය ගරුක හමුදාවක් ලෙස ප්‍රශංසා ලැබූ ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව නිදහස් උත්සවය සැමරුම් දිනයේදී ලබාගන්නා සුළු ආඩම්බර ගමන් ලීලාවකින් ගමන් කර අපගේද සිත් ඇද බැඳ ගති. ''මටත් එලෙස යන්නට ඇත්නම්.....'' බොහෝ අයට සේම ඔබටද සිතෙන්නට ඇත.

(i) ආචාර පෙළපාලියක් භාවිතාවන අවස්ථා 02ක් ලියන්න. (ල. 02)

(ii) ආචාර පෙළපාලියක මූලික ඉසව් දෙකක් ලියන්න. (ල. 02)

(iii) ආචාර පෙළපාලියක භාවිතා වන විවිධ හැරීම් දෙකක් නම් කරන්න. (ල. 02)

(iv) තුන්පෙළ සැදීමේ දී භාවිතා වන පහත දිශා හඳුන්වන්න.

පෙරමුණ, පසුපස වම, දකුණ (ල. 02)

(v) මෙවැනි ක්‍රියාකාරකම් පුහුණු වීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න. (ල.02)

03. උපන්දා සිට මියෙන තුරාම සෑම ජීවියෙක් ම චලනය වේ. ඉන් සමහරක් රිද්මයානුකුල චලනයි.

(i) රිද්මයක් පවත්වා ගැනීමේ වාසි 4ක් ලියන්න. (ල. 04)

(ii) රිද්මයානුකුල පා චලන 7 ක් නම් කරන්න. (ල. 04)

(iii) රිද්මයානුකුල පැනීම් 5ක් සහ කැරකීම් වර්ග 5ක් ලියන්න. (ල. 02)

04. ''සෞඛ්‍යවත් පාසල රටට සම්පතකි''.

(i) සෞඛ්‍යය ප්‍රවර්ධන පාසල් යනු මොනවාද? ( ල. 02)

(ii) සෞඛ්‍යය ප්‍රවර්ධන ආයතනයක් ලෙස පාසලක දක්නට ලැබෙන අරමුණු 04ක් ලියන්න. (ල. 04)

(iii) පාසල් සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහනක දී ඔබට ඒ සඳහා දායක විය හැකි අවස්ථා 04ක් ලියන්න. ( ල. 04)

05. පුද්ගලයකු සතු වටිනාම වස්තුව එම පුද්ගලයාගේ සෞඛ්‍යය වේ.

(i) පූර්ණ සෞඛ්‍යයයෙන් යුතු පුද්ගලයකු හඳුනා ගැනීම සඳහා යොදාගත හැකි නිර්ණායක මොනවාද? ( ල. 04)

(ii) පුද්ගල සෞඛ්‍යය අයහපත් වීම කෙරෙහි බලපාන අයහපත් ජීවන රටා 04ක් ලියන්න.(ල. 04)

(iii) පුද්ගලයකුගේ යහපත් සෞඛ්‍යය කෙරෙහි බලපාන හිතකර චර්යාවන් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

පළමු වාර පරීක්ෂණය - 2012
බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

| 8 ශ්‍රේණිය | ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | කාලය :- 1 1/2 |
|---|---|---|

නම :- ............................................ ඇ.අංකය :- ........................ පංතිය :- ..........

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

1. මනසි දියුණු කරගත් සත්වයා මිනිසාය. කිතුනු දහමට අනුව මනුෂ්‍යා හඳුන්වා ඇත්තේ,

(i) "අනික් සතුන්ට වඩා තර්කානුකූලව සිතන්නා" යනුවෙනි.

(ii) "භාවනා කරන්නා භාග්‍යවන්තයාය" යනුවෙනි.

(iii) මනස දියුණු කරගත් පුද්ගලයා මනුස්සයා" යනුවෙනි.

(iv) "සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝ" යනුවෙනි.

2. අපි මෛත්‍රී භාවනාව කිරීමෙන් බලාපොරොත්තු වන්නේ,

(i) සියලු සත්වයින් හට අනුකම්පා කිරීමය.

(ii) සියලු සත්වයින් සසරින් මුදවා ගැනීමයි.

(iii) සියලු සත්වයන්ට මෙත් වැඩීමයි.

(iv) මිනිසුන් හට නීරෝගී සුවය පැතීමයි.

3. මුස්ලිම් ආගමේ ශාස්තෘවරයා වන්නේ

(i) මව්ලවි තුමා (ii) මහම්මද් තුමා (iii) පූසාරිතුමා (iv) ලෙබ්බෙ

4. "ජීවිතයට අර්ථයක් නැතැයි සිතන්නාට අසතුටින් ජීවත්වීමට සිදුවනවා පමණක් නොව ඔහු සමාජයටද නොගැලපේ"

මෙම කියමන කාගේ අදහසක් ද?

(i) ලියෝ ටෝල්ස්ටෝයි (ii) ඇල්බට් අයින්ස්ටයින්

(iii) ජේ. ආර්. ජයවර්ධන (iv) බර්මෝල්ඩ් බ්‍රෙෂ්ට්

5. "හිපොක්‍රටිස්" නැමැත්තා හඳුන්වන අන්වර්ථ නාමය,

(i) ඉංග්‍රීසි සාහිත්‍යයේ පියා. (ii) ඉතිහාසයේ පියා

(iii) බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා

- හරි නම් (√ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

6. ''මොනාලිසා'' මයිකල් ආන්ජලෝගේ නිර්මාණයකි. (   )

7. ''මහත්මා ගාන්ධි'' තුමා ඉන්දියාවේ දියත්කලේ අවිහිංසාවාදී ව්‍යාපාරයයි. (   )

8. අනගාරික ධර්මපාලතුමා කිතුනු දහමට අගනා සේවයක් කල අයෙකි. (   )

9. ''දෙමාපියන්ට දණගසා වැඳීම බෞද්ධ මෙන්ම මුස්ලිම් අගමේ ද පවතින චාරිත්‍රයකි. (   )

10. 'අල්ෆ්‍රඩ් නොබෙල්'' යනු වසර කීපයක්ම නොබෙල් තෑග්ග ලබා ගත් අයෙකි. (   )

- හිස්තැන් පුරවන්න.

11. අපිට ඇතිවන චිත්තවේගී තාවයකි. ..................................................

12. නිතර නිතර චිත්තවේගවලට ලක්වන පුද්ගලයින්ට වැළඳෙන රෝගී තත්ත්වයකි. ..................................................

13. සුප්‍රකට ටජ්මහල් මන්දියර නිර්මාණය කළේ .................................................. රජුය.

14. ආදි කාලයේ අපේ මුතුන් මිත්තන් තමන්ට දැනුන තැලුව කාන්සිය මගහැරවා ගත්තේ .................................................. කිරීමෙනි.

15. මානසික පීඩා අවමකර ගැනීමට ඉතාම උචිත ක්‍රමයකි. .................................................. වැඩ කිරීම.

16. මහත්මා ගාන්ධිතුමාගේ චින්තනය (දර්ශනය) වන්නේ .................................................. යි.

17. වැඩකරන අතරතුර විවේකයක් ලබාගැනීමෙන් අපේ මනසට සැහැල්ලුවක් (ඇතිවේ./ ඇතිනොවේ)

18. අපි අපගේ චිත්තවේග නිතරම ප්‍රකාශ කල යුත්තේ, (යහපත් අයුරට/ සපල නොවන අයුරට)

19. යහපත් සිතිවිලි පෝෂණය කරන මූලාශ්‍රයකි. (නවකථා/. පවුල)

20. පුද්ගලයින්ගේ යම් යම් දේ සඳහා ක්‍රියාත්මක වන්නේ (සිතෙන් ලැබෙන පණිවිඩ ඇතුවය/ මනසින් ක්‍රියාත්මක වීමෙනි)

## II කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (i) ඔබ අයත්වන ග්‍රාමසේවා වසමේ නම ලියන්න.

   (ii) ඔබේ නිවස පිහිටි පලාත දිස්ත්‍රික්කය නම් කරන්න. (ල.3)

   (iii) ඔබේ පාසල පිහිටි ග්‍රාම නිලධාරී වසම කුමක් ද? (ල.3)

   (iv) ඔබට ලගම පිහිටි තැපැල් කාර්යාලයේ නම ලියන්න. (ල.3)

2. (i) සුභවාදී සිතිවිලි 4 ක් ලියන්න. (ල.4)

(ii) මනුෂ්‍යා පිළිබඳ බුදු දහමේ දක්වෙන්නේ කෙසේ ද? (ල. 4)

(iii) මිනිසා පිළිබඳව ජේසු තුමන් ප්‍රකාශකර ඇත්තේ කුමක් ද? (ල. 4)

3. (i) සීගිරිය, රුවන්වැලි සෑය, මින්නේරිය වැව යන අංග නිම කල පුද්ගලයින් නම් කරන්න. (ල.3)

(ii) සුභවාදීව සිතමින් ලෝකයට විශිෂ්ඨ දේ දායාද කළ පුද්ගලයින් 03කුගේ නම් ලියන්න. (ල.3)

(iii) පුද්ගලයින්ගේ සිතිවිලි වලට මූලාශ්‍ර 4 ක් ලියන්න. (ල. 3)

(iv) ඔබේ ප්‍රදේශයේ ජනතාව විසින් පිහිටුවා ඇති සමිති සමාගම් මොනවාදැයි ලියන්න.

4. (i) මිනිසුන්ගේ සිත තුල පහලවන චිත්තවේග වර්ග 4 ක් ලියන්න.

(ii) දුක, සතුට, යන චිත්තවේගයන් ඇතිවූ පුද්ගලයකුට ඔහුගේ ශරීරයෙන් දිස්වන ප්‍රතිකීන් මොනවා ද?

(iii) නිතර නිතර චිත්ත වේගවලට ලක්වන පුද්ගලයෙකුට ඇතිවන රෝගී තත්ත්වයන් මොනවාදැයි ලියන්න.

5. (i) ඔබට හෝ ඔබේ මිතුරෙකුට ඇතිවන අයහපත් චිත්තවේග තත්ව පාලනය කර ගැනීමට ඔබ කරන හෝ යහලුවාට දෙන උපදෙස් මොනවාදැයි ලියන්න.

(ii) අතීත කාලයේදී අපේ මුතුන් මිත්තෝ ඔවුන්ගේ එදිනෙදා පාලුව කාන්සිය මගහරවා ගත් ආකාරය ලියන්න.

(iii) ඔබගේ රට හෝ මව හෝ ජාතිය පිළිබඳ හැඟීම් පුබුදාලන කවියක් ලියන්න.